086

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2008/2009**

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය II- LWU 2314**

**කාලය පැය 03 යි.**

---

දිනය - 2009 මාර්තු 27 වන දින වේලාව - පෙ.ව.09.30- ප.ව.12.30 දක්වා

---

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න **පහකට** (5) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

## <u>I වන කොටස - මූලික අයිතිවාසිකම්</u>

01. උපතින්ම බිහිරි පුද්ගලයකු වූ සිල්වා මහතා ප්‍රියකරන සන්නිවේදන ක්‍රමය වන්නේ සංඥා භාෂාවයි. කිහිප ආකාරයක අසනීප තත්ත්වයන්ගෙන් පෙළුණු මොහු දින කිහිපයක් කොළඹ ජාතික රෝහලේ නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමට ද යොමු විය. නමුත් සිල්වා මහතා සමග සන්නිවේදනය කිරීමට අවශ්‍ය වන සංඥා භාෂා අර්ථ නිරූපණය කරන්නෙකුගේ සේවය රෝහල විසින් කිසිදු දිනක සපයා නොතිබුණි. සිල්වා මහතා තර්ක කර සිටින්නේ සංඥා භාෂා අර්ථ නිරූපණය කරන්නෙකුගේ සේවය ලබා නොදීම නිසා වෛද්‍යවරු හා අනෙකුත් වෛද්‍ය සේවා සපයන්නන් සමඟ සන්නිවේදනය දුර්වල තත්ත්වයකට පත්වන අතර එනිසාම වැරදි රෝග විනිශ්චයන් හා අකාර්යක්ෂම ප්‍රතිකාර ලැබීමට හැකියාව ඇති බවයි.

    සංඥා භාෂා අර්ථ නිරූපණය කරන්නෙකු ලබා නොදීම මගින් වෛද්‍ය ප්‍රතිකාර ලැබීමට තමාට ඇති සමානාත්මතාවයේ අයිතිවාසිකම උල්ලංඝනය වන බවට ප්‍රකාශයක් ලබා ගැනීමේ අරමුණින් සිල්වා මහතා මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කරයි.

    මෙම නඩුව විසඳනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඔබ යයි උපකල්පනය කරමින් අදාළ අධිකාරීන් භාවිතා කර ඔබේ තීරණය ලියා දක්වන්න.

02. 'විවිධ වූ වාණිජ හා කාර්මික කාර්යයන් ඉටු කිරීමේදී ඉතා ඉහල මට්ටමක විශේෂඥ වෘත්තීය සුදුසුකම් හා තාක්ෂණික වටපිටාවක් අවශ්‍ය වන නිසාම සහ පොදුවේ රාජ්‍ය ආයතන තුල ක්‍රියාත්මක වන අනම්‍ය හා කල්ගත වන කාර්යය පරිපාටිය මෙන්ම නීති රීති ආදියට අනවශ්‍ය ලෙස සිරවීම නිසා සෙමින් ක්‍රියාත්මක වන කාර්ය පරිපාටියක් උරුම වීමේ ප්‍රතිඵලය වන්නේ මෙකී රාජ්‍ය ආයතන පොදු සංස්ථා බවට පත්වීමට බලපෑමක් ඇති වීමයි. නමුත් එසේ සංස්ථාගත කිරීම මගින් රජයට හා රාජ්‍ය ආයතන වෙත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පැවරෙන මූලික අයිතිවාසිකම් කෙරෙහි ගරු කිරීමේ, ආරක්ෂා කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ වගකීමෙන් නිදහස් වීමේ අවසරයක් හිමි නොවේ.'

    Per Athukorale J. in
    ***<u>Rajaratne</u>*** vs. ***<u>Air Lanka Ltd. And others</u>*** (1987) 2 Sri LR 128

    ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව තුල දැක්වෙන 'විධායක හා පරිපාලන ක්‍රියා' යන වාක්‍යය කොටසේ වපසරිය හා අදාළත්වය ඉහත ප්‍රකාශය ඇසුරින් සාකච්ඡා කරන්න.

03. මුස්ලිම් ජනවර්ගයට අයත් වන සියළුම දෙනා තම ආගම අතහැරීම හෝ රැකියාවෙන් ඉවත්වීම යන තෝරා ගැනීම් දෙකින් එක් තෝරා ගැනීමක් කළයුතු බවට X රාජ්‍යයේ නව ජනාධිපති වන තොම්සන් මහතා ප්‍රකාශ කර සිටී. තවද ආරක්‍ෂක හේතූන් මත මුස්ලිම් කාන්තාවන් තම හිස ආවරණය කිරීමද මොහු තහනම් කරයි. මුස්ලිම් ජාතිකයන් දෙදෙනෙකු වන රියාස් සහ නෆ්නා මේ රීතීන් හරහා පීඩාවට පත් වූහ.

ජනාධිපතිගේ මතයට විරුද්ධව මත දරමින් ඩේලි ලීඩර් පුවත්පත දිගින් දිගටම මේ සම්බන්ධව ලිපි පළකිරීම නිසාම එම පුවත්පත තහනම් කිරීමට රජය උත්සාහ දරයි. රජයට විරුද්ධව පෝස්ටර් සහ බැනර් ප්‍රදර්ශනය කරමින් පුවත්පත් කාර්ය මණ්ඩලය විරෝධතාවයක නිරත වෙමින් සිටින අතරතුරදී පොලිසිය මැදිහත් වී පුවත්පත් කාර්ය මණ්ඩලයට තුවාල සිදු කරමින් පෝස්ටර් හා බැනර් විනාශ කර දමන ලදී.

පහත පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සාකච්ඡා කරන්න.

(අ) රියාස් සහ නෆ්නා
(ආ) පුවත්පත් කතෘ සහ පුවත්පත් කියවන්නා

X රාජ්‍යයේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට සමාන බව උපකල්පනය කරන්න.

04. අරවින්ද විසින් කුරුණෑගල සිට, කඩුවෙල පිහිටි සිය නිවස වෙත ගෘහ භාණ්ඩ ප්‍රවාහනය කරමින් සිටින අතරතුර පොලිස් මාර්ග බාධකයකදී ඔහුව නවත්වන ලදී. ලොරි රථය පරීක්‍ෂා කිරීමෙන් අනතුරුව රුපියල් 10,000/= ක අල්ලස් මුදලක් ඉල්ලා සිටි පොලිස් නිලධාරීන් තර්ජනය කරමින් කියා සිටියේ අදාල මුදල නොගෙවන්නේ නම් නීති විරෝධී ගෘහ භාණ්ඩ ප්‍රවාහනය යන චෝදනාව යටතේ අරවින්දට එරෙහිව නඩු පවරන බවයි. අරවින්ද මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී. නිසි බලධාරියාගෙන් ලබා ගත් ගෘහ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ අවසර පත්‍රය පෙන්වා සිටියද ඔහුගේ නිර්දෝෂී භාවය නොසලකා අරවින්දව අත් අඩංගුවට ගෙන උග්‍රලෙස අඩන්තේට්ටම් සිදු කරමින් ඔහු සහ ලොරි රථය පොලිස් ස්ථානය වෙත ගෙන යන ලදී. දැඩි වේදනාවක් ඇති කරමින් වයරයකින් අරවින්දට පහර දුන් අතර ඔහුට තුවාල සිදු කිරීමද, මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් නොකර ඔහුව රඳවා තබා ගැනීමද සිදු කරන ලදී. උදව් ඉල්ලමින් අඬමින් සිටි අරවින්ද වතුර ඉල්ලා සිටි විටක දී වතුර වෙනුවට ඇසිඩ් පිරවූ භාජනයක් ඔහු වෙත ලබා දෙන ලදී. අරවින්ද එය පානය කිරීම ප්‍රතිෂේප කල විට එය බලෙන් ඔහුගේ මුවට වත් කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් එදිනම රාත්‍රියේ අරවින්ද මිය ගියේය.

පොලිස් නිලධාරීන්ට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කිරීමට අරවින්දගේ බිරිඳ වන නිමලා අදහස් කරයි.

නිමලාට උපදෙස් දෙන්න.

## II වන කොටස - බලතල බෙදීම

05. 'ස්වකීය කටයුතු පරිපාලනය කිරීම උදෙසා ඒ පළාතේ ජනතාව විසින් ස්වකීය සර්වජන ඡන්ද බලය භාවිතා කරමින් ස්වකීය නියෝජිතයන් තෝරා පත් කර ගනු ලබන්නේ ය. මේ යටතේ පළාතේ ජනතාවගේ අභිප්‍රායයන් මුදුන් පත් කරනු වස් පළාත් නියෝජිතයන්ගේ බහුතර විශ්වාසය දිනාගත් පුද්ගලයා මහා අමාත්‍ය වරයා ලෙස පත් කිරීමට ආණ්ඩුකාර වරයාට අභිමතය ඇත්තේය. මෙම අභිමතය පුද්ගලික හෝ දේශපාලනමය වන වෙනත් අරමුණක් වෙනුවෙන් ලබා දෙන දෙයක් නොවේ.'

Per G.P.S.De Silva C.J in
***Premachandra vs.Major Montague Jayawickrema and another***
(*provincial governors' case*)(1994) 2 Sri L R 105

අදහස් දක්වන්න.

06. පළාත් සභාවන්ගේ ව්‍යවස්ථාදායක බලයෙහි ක්‍රියාකාරීත්වය විමසීමේදී උත්තරීතර හෝ ස්වාධීන බලයක් පළාත් සභාවෙත ලබා නොදුන් බවට 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන නඩු කරයේ බහුතර තීරණයෙන් දැක්වේ.

ඔබ මේ ප්‍රකාශය සමග එකඟ වන්නේ ද ? විනිශ්චිත නඩු තීරණ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන දක්වමින් ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

07. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කල 13 වන සංශෝධනය මගින් අාදල පළාත් සභාවට අධිකරණ කාර්යයන් හෝ ක්‍රියාවලිය සම්බන්ධයෙන් පාලනයක් නොමැති බවට විවේචනයක් පවතී. කෙසේ නමුත් පෙනී යන කරුණක් වන්නේ 13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් බෙදන ලද බලය නැවත සකස් කිරීමක් පමණක් සිදු කර ඇති අතර ජනතාවගේ නිවසට ම යුක්තිය සමීප කරමින් ප්‍රමාදය හා වියදම් අවම කිරීමක් සිදු වී ඇති බවයි.

අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන හා විනිශ්චිත තීරණ දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

08. පහත සඳහන් ඕනෑම දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) පළාත් පාලනය එ. බලය බෙදීම
(ආ) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකුල වාදය
(ඇ) පළාත් රාජ්‍ය සේවය
(ඈ) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 2 වන ව්‍යවස්ථාව සහ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

හිමිකම් ඇව්රිණි.